**පාතහේවාහැට ප්‍රාදේශිය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 09 දින ද විගණනයට ඉදිරිපත් තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

**1.2 මතය.**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරික්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබද මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 80 ක්, සුසාන භූමි 34 ක් සහ ප්‍රජා ශාලා 30 ක අගය තක්සේරු කර, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ඖෂධ තොග අයිතම 278 ක පරිගණක 02 ක විදුලි ගබඩා විෂයයන් 14 ක, පොදු ගබඩා විෂයයන් 44 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ දි වෙන්දේසියක් මගින් ඉවත් කරන ලද රු.132,750 ක් වටිනා වතුර බවුසර ට්‍රේලරයේ අගය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) සමුච්චිත අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට පැවති රු.41,170,136 ක ශේෂය, ශේෂ පත්‍රයේ සංවර්ධන සංචිත යටතේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.19,250,734 ක් වූ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය, ශේෂ පත්‍රයේ ණය මුදාලීම යටතේ දක්වා තිබුණි.

**1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

පාලන ගිණුම් අනුව ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන්ගේ එකතුව රු.4,496,620 ක් වූ අතර, ඊට අදාළව උපයෝගී ලේඛනයට අනුව ශේෂයන්ගේ එකතුව රු.4,527,820 ක් විය.

**1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

**(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>**

2013 ඔක්තෝබර් 09 දින වන විට විගණන විමසුම් 09 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.952,000 ක් විය.

(ආ) **<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,927,241 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය

**2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,276,200 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,249,230 ක් විය.

**2.2 <u>ආදායම් පරිපාලනය</u>**

**2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 2,481 | 2,472 | 6,515 |
| (ii) | බදු කුලී | 2,421 | 3,463 | 1,532 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,856 | 2,201 | -- |
| (iv) | වෙනත් ආදායම් | 19,975 | 25,600 | 19,007 |

**2.2.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,342,409 |
| (ii) | මුද්දර ගාස්තු | 11,436,843 |

**2.2.3 <u>සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු</u>**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 අති විශේෂ ගැසට් නිවේදනය අනුව, දුරකථන (විදුලි සංදේශ) කුළුණු සඳහා උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් එකකටම රු.100 බැගින් ගාස්තු අය කළයුතු වුවත්, අනවසරයෙන් ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 30 කට අදාළව ලබා ගතයුතු රු.750,000 කට අධික ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) සම්ප්‍රේෂණ කුළුණු මගින් සන්නිවේදන පහසුකම් ලබා දෙන ආයතනවලින් වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අය කර ගතයුතු වුව ද, කුළුණු 30 ක් සඳහා ගාස්තු අය නොකිරීම හේතුවෙන්, 2012 වර්ෂයේ දි රු.90,000 කට අධික ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) බල ප්‍රදේශය තුළ ඉදි කර ඇති අනවසර සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරින් විසින් කරන ලද වාර්තා කිරීම් අනුව, විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් යථෝක්ත ගැසට් නිවේදනය අනුව, උස සෑම මීටර් 05 කටම රු.10,000 ක් බැගින් ගාස්තු අය නොකිරීම හේතුවෙන්, රු.1,200,000 කට පමණ ආදායමක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව, සෑම ඉදි කිරීමක්/ සංවර්ධනයක් සඳහා ම අනුකූලතා සහතික ලබා ගතයුතු වුව ද, සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ කුළුණු 4 ක් සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හේතුවෙන්, රු.94,000 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 **<u>ඉඩම් අනු බෙදීම්.</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1 %ක බද්දක් සභාව වෙත ගෙවියයුතුය. එසේ වුව ද, විකුණන ලද

පර්චර්ස් 390 ක ඉඩම් වෙනුවෙන් පර්චර්ස් 01 ක් රු.20,000 ක් බැගින් විකිණීමෙන් සභාවට අය වියයුතු රු.78,000 ක පමණ ආදායමක් අය කර ගෙන නොතිබුණි.

(ආ) 1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ 20 වගන්තියට අනුව, යම් ඉඩම් කැබැල්ලක් හෝ බිම් කොටසක් අනු කොටස්වලට බෙදීමට පෙර එයට අදාළ සංවර්ධන බලපත්‍රයන් ලබා ගතයුතු වුව ද, පර්චර්ස් 390 ක ඉඩමක් සඳහා අනුමැතියක් නොමැතිව අනු කොටස්වලට බෙදා වෙන් කර තිබුණි.

(ඇ) ඉහත ඉඩම වෙන්දේසි කිරීමට අදාළව ප්‍රචාරක බැනර් 25 ක් ප්‍රදේශය තුළ අනවසරයෙන් ප්‍රදර්ශනය කර තිබුණ ද, ඒ සඳහා කිසිදු ගාස්තුවක් සභාව විසින් අය කර නොතිබුණි.

(ඇ) 1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ 22 වගන්තියට අනුව, අනු බෙදීමට අදහස් කරන ඉඩම් කොටස හෝ භූමි භාගය හෙක්ටයාර් එකකට (01) වැඩි වන අවස්ථාවක දී, වීථි අත් හැරීමෙන් පසු ඉඩමේ හෝ භූමි භාගයේ විශාලත්වයෙන් 10% කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා වෙන් කර තැබියයුතු වුව ද, එම බිම් ප්‍රමාණය ඔප්පුවක් මගින් ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නොතිබුණි.

**2.3** <u>නිෂ්ක්‍රීය වත්කම්.</u>

සභාව සතුව පවතින අත් ට්‍රැක්ටරයක් වසර 04 කට වැඩි කාලයක් ධාවනය නොකර, නිෂ්ක්‍රීය තත්ත්වයේ පවතින අතර, එම වාහන අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා සිදු කර, ප්‍රයෝජනයට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.** <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) මානව සම්පත් කළමනාකරණය